19/07/2011 - ලංකාදීප

**ප්‍රජාතන්ත්‍රවාදය රටටත් වර්තමානයටත් ගලපමු - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලාංකේය මැතිවරණ පුරාණයට අවුරුදු අසූවක් සම්පූර්ණ වී තිබේ. ආසියාවේ කුඩා රටක් වන නමුත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සම්බන්ධයෙන් අපට ඇත්තේ පැරණි හා දීර්ඝ ඉතිහාසයකි. 1931 ජුනි 13 වැනිදා ස්වකීය මහජන නියෝජිතයන් තෝරා ගැනීමේ පළමු ඡන්දය මෙරට පවත්වා ඇත. අද සමාජයට ඒ වැදගත් අවස්ථාව සිහිපත් වූයේ නැත. අමතක කළේය. එදා කාන්තාවන් හා පිරිමින්ට ද ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය හිමිවිය. කැපවීමෙන්, මහජනතාවගේ උවමනා එපාකම් සොයා බලන නියෝජිත දේශපාලන ක්‍රමයක් මෙමගින් මෙරටට ලැබිණ. ජනතා කැමැත්තෙන් පාලකයන් තෝරාගැනීමේ ක්‍රමවේදය අවුරුදු අසූවක් අවසානයේ දී විවිධ වෙනස්කම් වලට භාජනය වී තිබේ. එය රටට ලැබුණ බව අපට අමතකය. ජනතා පරමාධිපත්‍යය ගැන තක්සේරුව කණගාටුදායකය. එහි අවස්ථාව උපයෝගී කර ගෙන ඇත්තේ බලය, අධිපතිවාදය තහවුරු කිරීමය. යුක්තිය, සාධාරණත්වය හා ජන සම්මුතිය තහවුරු කිරීමට නොවේ. ගතවූ දසක අට තුළ ප්‍රජාතන්ත්‍රවාදය මෙවැනි ඉරණමකට ගොදුරු වී ඇත්තේ මක් නිසාද?

ත්‍රස්තවාදී ගැටුම් අවසන් වී වසර දෙකකි. අවුරුදු තිහකට අධික කාලයක් නොසන්සුන් වාතාවරණයක් රට තුළ පැවතින. එය අන්ධකාර යුගයකි. මහජනතාව භීතියෙන් පසුවිය. බෝම්බ පුපුරන, වෙඩි හඬ පැතිරෙන සිද්ධි ජන ජීවිතයේ සාමාන්‍ය අංග බවට පත්වෙමින් තිබිණ. මරණය සුලබ අත්දැකීමක් වූ අතර ජාතීන් අතර වෛරය හා ඝාතන සංස්කෘතිය පැතිරිණ. මානුෂික මෙහෙයුම අවසානයේදී ගිනි අවි නිහඬ වූයේ ත්‍රස්තවාදය තුරන් කරන ලද බව සංකේතවත් කරමින්ය. ගැටුම් සහිත දශක තුන ඇතුලත ජනතාව සතු ප්‍රජාතන්ත්‍රවාදී බලය අභිබවමින් ආණ්ඩු බලය පැතිර ගියේය. ක්‍රමානුකූලව හිස එසවූ මෙම පීඩනය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ අක්‍රිය කළ අතර මහජනතාව අසරණ භාවයට පත් කළේය.

පොලිස් නිලධාරියා ගේ භාවිතාව බැටන් පොල්ලේ සිට ටී පනස් හයේ ගිනි අවිය දක්වා විකාශනය මෙයට සංකේතයකි. ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ ත්‍රස්තවාදය මඩිමින් විශාල ඉදිරි ගමනක් පෙන්වද්දී ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය විශාල පරිවර්තනයකට ලක්විය. ඡන්දය ප්‍රකාශ කිරීමෙන් දේශපාලන පක්ෂ නියෝජිතයන් බලයට පත්කිරීමට වඩා එහි ගැඹුරක් තිබිණ. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යටතේ බලය සතු මහජනතාවටය. පරමාධිපත්‍යය සතු ඔවුන්ටය. නමුත් යුද වකවානුවක දී රට හා මහජනතාව ආරක්ෂා කිරීමේ බලය රජයට පැවරෙයි. ආරක්ෂාව වැදගත්ය. එහෙයින් රජය වටා බලය කේන්ද්‍රගතවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය අනුව මහජනතාව අත තිබිය යුතු බලය රජය අතට පත්වීම නිසා ආණ්ඩු බලවත් ය. මහජන මතයට වඩා ආණ්ඩුවේ බලය සහ බලහත්කාරය නිරායාසයෙන් ම ඉහළට මතුවූයේය. ගැටුම් සහිත පසුබිමක එය වැළැක්විය නොහැකි තත්ත්වයකි. දැන් ත්‍රස්තවාදය අවසන්ය. ගැටුම් අවසානයේ සාමකාමී තත්ත්වයක් උදා වී තිබේ. ටී පනස් හය යළිත් බැටන් පොල්ල දක්වා ආපසු පැමිණිය යුතුය. ආණ්ඩුව සතු බලය මහජනතාව අතට පත්විය යුතුය. එය කළ හැක්කේ කෙසේද?

පසුගිය වසර තිහ තුළ අප රට ත්‍රස්තවාදී බලවේග පරාජය කරන යුද්ධයක පැටලී සිටින අතරවාරයේ ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය වේගයෙන් වෙනස්විය. ඉදිරියට ගියේය. මැතිවරණ මගින් මහජන නියෝජිතයන් තෝරා ගැනීමේ සම්ප්‍රදායයන් සහ ප්‍රජාතන්ත්‍රවාදයේ ගුණාංග උප අතර එසේ ම තිබිය දී දියුණු වූ ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණ රටට අත්පත් කර දීමේ අභියෝගය අද අප හමුවේ තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණුව සමග සමාජය හා පොදු සංවිධාන බලවත් ව ඇත. මහජනතාවගේ මතය බලවත් වී ඇති අතර කෙළින්ම මහජනතාවගේ හඬ පාලකයන් වෙත සන්නිවේදනය වන පසුබිමක් නිර්මාණය වී තිබෙන බව නිරීක්ෂණය කළ හැකිය. මෙයට බෙහෙවින් දායක වී ඇත්තේ තොරතුරු තාක්ෂණ දියුණුවයි. දැනුම සමාජයේ පදනම බවට පත්ව ඇත. එයින් තොරතුරු හුවමාරුව වේගවත් කර තිබේ. පුද්ගලයෙකු දරන මතය පොදු මතයක් බවට පත්කර හඬක් ගොඩනගන්නට ඇති ඉඩ කඩ

පුළුල් වී ඇත. මෙය මෑත කාලය තුළ ප්‍රජාතන්ත්‍රවාදය මුහුණ පෑ විශාල අවස්ථාවකි. ලෝකයේ කොතැනක හෝ සිටින පුද්ගලයෙකුට මතයක් බිහි කළ හැකිය. එකී මතය දරන සමාන අදහස් ඇති පුද්ගලයන්ට පණිවුඩය වටා එකතු වී විශාල බලවේගයක් ගොඩනැගීමට අවස්ථාව සැකසේ. අන්තර් ජාලය, වෙබ් අඩවි, බ්ලොග් සහ ට්විටර් වැනි සමාජ සම්බන්ධතා ඇතිකරන මාධ්‍ය, දේශ සීමා පවුරු බිඳ දමමින් ලෝකය පුරා අලුත් සම්බන්ධතා ඇති කර තිබේ. මෙවැනි පැති මගින් සම්ප්‍රදායික රාමු අභියෝගයට ලක්ව ඇති අතර රටවල් පුරා ඇති නීති රීති අභිබවමින් මත ගොඩනගන්නට පටන්ගෙන තිබේ. ජාත්‍යන්තර සමාජය තුළ තොරතුරු තාක්ෂණයේ දියුණුවක් ඇති නමුත් අපට එහි ප්‍රතිඵල ලැබෙන්නට තවත් කාලයක් ගත විය හැකි යැයි කල්පනා කිරීම වැරදිය. ජංගම දුරකථන භාවිතාව එයට හොඳ උදාහරණයකි. අවුරුදු හත අටකට කලින් ජංගම දුරකථනය ධනවත් සමාජයේ පරිහරණය වූ සුඛෝපභෝගී මෙවලමකි. අද සමාජයේ කිසිවෙකුට ජංගම දුරකථනය නැති යුගයක්ගැන සිතා ගැනීමට නොහැකිය. තාක්ෂණය එලෙස වේගයෙන් සමාජය පුරා පැතිර යයි. තාක්ෂණය පුද්ගල අදහස් ඉදිරියට ගෙන එන අතර ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංග විකාශය වී නොයෙක් පැති කරා ගමන් කර ඇති බව පෙනේ.

අතීතයේ කාන්තාවන්ට ඡන්ද අයිතිය නොතිබිණ. එහි තිබුණේ පුරුෂයා තීන්දු ගන්නා සමාජයකි. අධ්‍යාපනය ලැබීම අතින් කාන්තාව ඉහළට පැමිණ තිබේ. කාන්තාවන්ට සමාජයේ හිමි තැන පැහැදිලිවම වෙනසකට භාජනය වී ඇත. කාන්තාව පරිපාලනයට සම්බන්ධ වූ අතර දේශපාලනයට අවතීර්ණ විය. ලෝකයේ ප්‍රථම කාන්තා අගමැතිනිය තෝරා ගැනීමෙන් අප රටට අත්වූයේ අභිමානයකි. ප්‍රථම විධායක ජනාධිපති ධුරය ගැන කියැවෙන්නේ ලංකාව සමගය. ලෝකයේ සෙසු රටවල දේශපාලනයට පැමිණෙන කාන්තාවන්ගේ පැමිණීම වේගයෙන් ඉහළ ගියේය. අද බොහෝ රටවල කාන්තාවන් ගේ දේශපාලන නියෝජනය ඉහළ මට්ටමක පවතී. ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග දියුණු රටවල කාන්තා හා පිරිමි නියෝජනය සම මට්ටකට පැමිණ ඇති අතර කැබිනට් මණ්ඩලයේ හා පරිපාලන අංශයේ ඉහළ තැන් උසුලන්නේ කාන්තාවයි. අලුතින් ප්‍රජාතන්ත්‍රවාදයට එකතුවන අප්‍රිකානු හා දකුණු ඇමරිකානු රටවල්වල කාන්තා නියෝජනය ඉහළය. කාන්තාවන්ට දේශපාලනයේ හා සමාජයේ අවස්ථාව වැඩි සමාජ තුළ ප්‍රජාතන්ත්‍රවාදය තියුණු වෙනසකට ලක්විය. ප්‍රශ්න තේරුම් ගන්නා ආකාරය හා ඒවාට විසඳුම් යෝජනා වූයේ වඩා සංවාදශීලී අන්දමටය. එය සමාජයට ආශ්වාදයක් හා ප්‍රජාතන්ත්‍රවාදයට ශක්තියක් වූ බව නිසැකය. අද අපට ද යහපත් දේශපාලන සංස්කෘතියක් උදෙසා කාන්තා නියෝජනය වැඩි කරන නීති රීති පැනවීම ගැන අවධානය යොමු කළ හැකිය.

මාධ්‍ය නිදහස, මානව අයිතිවාසිකම්, පුරවැසියන්ට සමාන අවස්ථා, තොරතුරු ලබා ගැනීමේ අයිතිය සහ පැවති සමාජ විෂමතා තුරන් කිරීමට හේතු වන විවිධ පණත් මෑත භාගය තුළ ලෝකය තුළ පිළිගැනීමට ලක්ව තිබේ. මිනිසුන්ගේ අයිතිවාසිකම් හා ආරක්ෂා කරන අතර පරිසරය හා සමාජය ගැන තුලනාත්මකව බලන්නට මෙම තත්ත්ව බලපෑවේය. ප්‍රජාතන්ත්‍රවාදයට මෙම වෙනස්කම් විශාල පිටුවහලක් වූ අතර මනුෂ්‍ය ජීවිතයේ ගුණාංග හා වටිනාකම් ඉහළ නැංවීය. ඡන්දය ප්‍රකාශ කර ආණ්ඩු පිහිටුවීමෙන් බහුතරයගේ මතය පෙන්වන ආණ්ඩු පිහිටුවීමෙන් පමණක් සෑහීමකට පත්නොවන සමාජය බිහිවීම මෙහි ප්‍රතිඵලයකි. අද ප්‍රජාතන්ත්‍රවාදයේ ගමන කොතරම් සියුම්වී ද යත් බහුතරය යම් කාරණයක් ගැන එකඟවීම බහුතරයේ ඒකාධිපතිවාදයක් සේ සලකන තරමට පත්ව තිබේ. සුළුතරයේ මතය නොසලකා හැරිය යුතු නැති අතර නිවැරදි මතය දරන සුළු පිරිස තුළ වුවත් ශක්තියක් තිබිය හැකි බව පිළිගෙන ඇත. ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතරය දරන අදහසයැයි මෙතෙක් පැවති නිර්වචනය මෙම තත්ත්වය යටතේ විවාදයට බඳුන් වී ඇති බව පෙනේ.

මේ අනුව අප රට ප්‍රවේශ වී සිටින්නේ අලුත් යුගයකටය. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය දියුණු සමාජවල කතා කරන සංකල්ප අපට ලබා දෙන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදයේ වෙනස් වී ඇති ලක්ෂණ අධ්‍යයනය කර එයින් යමක් භාවිතාවට ගැනීම අද අපට ඇති අභියෝගයයි. බටහිර රටවල් ශ්‍රී ලංකාව දෙස බලන්නේ යුද වකවානුවක සිටි ලබ්ධි මතධාරී පාලකයන් දෙස බලන අන්දමටය. යුද පරිසරය තුළ රජය සතු වූ බලය ආපසු සමාජයට පවරන්නට අප සූදානම් බව ඇඟවීම අවශ්‍යය. ප්‍රජාතන්ත්‍රවාදයේ නව ප්‍රවනතා සමාජය අත්විඳින්නට සූදානම් බව පෙන්විය යුතුය. එය පහසු නැත. එකී රටවල් පරිසරය,

මානව හිමිකම්, මාධ්‍ය නිදහස හෝ තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන කතා කරන විට අපට ශ්‍රිනෙන්නේ ඔවුන් ගේ නීති අපේ රටට බලහත්කාරයෙන් හඳුන්වා දෙන්නට යන බවකි. ගැටුම ඇති වන්නේ එවිටය. බටහිර විරෝධයක් සමාජය තුළ ඇති කරන්නට හේතු වී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදයේ මේ පරතරය බව වටහා ගැනීම අවශ්‍යය.

ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින් මහජනතාවගේ අතට බලය ලබා දීමේ සැලැස්ම අද සලකා බැලීම වටී. ආණ්ඩුව සියල්ල කිරීම නොව මහජනතාව විසින් තමන්ට අවශ්‍ය දේ කර ගන්නා සමාජයක් ගොඩනැගිය යුතුය. ගොඩනැගෙන එම සමාජය තුළ සිවිල් සංවිධාන බලවත්ය. පුද්ගලයෙකු නගන හඬටත් ඉඩක් තිබේ. සුළු ජාතිය කොන් කිරීමක් නැත. සමානාත්මතාවය ඉහළය. බෙදීම් නැත. ජාති ආගම් අනුව පමණක් නොව, පන්ති පරතරයක් ද තිබිය යුතු නැත. පංති බෙදීම බරපතල වීම නිසා අතීතයේ දී රුධිරය ගැලූ විප්ලවයක් සිදුවිය. සමාජය ශක්තිමත්වන විට යුක්තිය හා සාධාරණත්වයට තැනක් තිබේ. තවත් පුද්ගලයෙකු යටපත් කරගෙන අධිපතිවාදී අන්දමට ක්‍රියාකිරීම වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදයට නොගැලපේ. එවැනි අලුත් යුගයකට ප්‍රවේශ වන්නට අපට ශක්තිය තිබේද?

සමාජය ගෝලීයකරණයට ලක්ව ඇත. විවෘත ආර්ථික ක්‍රමය නිසා ගෝලීයකරණය ගැන අත්දැකීම් අපට ලැබුණි. සාමාන්‍ය ජනතාව ලෝකයේ නොයෙක් තැන නොයෙකුත් රැකියා කරමින් ආදායම් උපයයි. ලෝක ආර්ථිකයේ වෙනස්කම් ගමේ කර්මාන්තශාලාවේ නිෂ්පාදනයෙහි නිරත වැඩකරන ජනතාවට අවබෝධයක් ඇත. ඇඟලුම් ඉල්ලුම අඩු වැඩි වන්නේ, තේ හෝ රබර් මිළ ඉහළ පහල යන්නේ ගෝලීයකරණය වූ ආර්ථිකය නිසා බව ඔවුහු දනී. ගෝලීයකරණය වූ සමාජය අපට තවමත් හුරු නැත. මෙරට පුරවැසියන්ගෙන් දස ලක්ෂ සංඛ්‍යාත පිරිසක් විදේශ ගතව ජීවත් වෙති. යුද සමයේ රට හැර ගිය පුර වැසියන්ට රට ගැන, රටේ පාලනය ගැන ඇත්තේ වෛරයකි. කීයක් හෝ උපයා ගෙන යළි මවුබිමට පැමිණෙන අදහසින් ගිය තවත් කොටසකට තමන් වෙසෙන රටවල ඇති අවස්ථා, විනය හා යුක්තිසහගතබව දැනෙන විට ඔවුහු ස්වකීය මවුබිම එවැනි තත්ත්වයක් උදා නොකරන්නේ දේශපාලනයයැයි සිතන්නට පටන් ගෙන ඇති අතර එය අවාසනාවකි. විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රමාණය සුළු එකක් නොවේ. අද රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධාන ම මාර්ගය ඔවුන් මෙරටට එවන ධනයයි. මෙම පිරිසට ද මතයක් තිබේ. ලෝකයේ නොයෙක් රටවල් මෙලෙස විදේශගත පිරිස තමන් හා සම්බන්ධ කර ගැනීමට විධි විධාන යොදා ඇත. ඇතැම් රටවල විදේශගතව සිටින්නන්ට ද මැතිවරණයක දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ඇත. ජාතීන් වශයෙන් නොව රටේ පුරවැසියන් සේ සලකා මෙම පිරිස රටේ පාලන ව්‍යුහයට සම්බන්ධකර ගත යුතුය. දේශපාලනයේ දී තමන්ට අවාසියක් වන හෙයින් මෙම පිරිස සතු අයිතීන් අමතක කිරීම යුක්තිය නොවේ. මෙම පිරිසෙන් කොටසක් ද්විත්ව පුරවැසි භාවය ලබා තිබේ. තවත් රටක පුරවැසිභාවය ලැබූ අපේ රටේ ජනතාව අත්හැර දැමීම සුදුසු ද? ඔවුන් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද? අද අපට ඇති ගැටලු අතර මේවා ද තිබිය යුතුය.

යුද්ධය දිනා ගැනීමට රජය ශක්තිමත් කළ නමුත් රජයට පමණක් ආර්ථික අභියෝග ජය ගැනීම පහසු නැත. රටේ සෑම පුද්ගලයෙකුම ආර්ථිකයේ කොටස්කරුවෙකි. හැම කෙනෙකුම ව්‍යවසායකයෙකු විය යුතුය. සියල්ල ආණ්ඩුවෙන් කර දෙන සංවර්ධනයක් තුළ ආර්ථිකය වර්ධනය නොවේ. හැම දෙනාම නිෂ්පාදනයට දායකවන, ආර්ථික සංවර්ධනයට සම්බන්ධවන සැලසුම් සකස් කිරීම වටී. එය කළ හැක්කේ ආකල්ප වෙනසක් මගින් පමණී. රජය පමණක් නොව පුද්ගලික අංශය ට ද ආර්ථිකයේ සාධාරණ අවස්ථා තිබිය යුතුය. එය ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණු ලක්ෂණයක් පමණක් නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය එකිනෙකට වෙනස් සිංගප්පූරුව, මැලේසියාව හා චීනය වැනි රටවල පවා පුද්ගලික අංශයට ආර්ථිකය තුළ ඇති අවස්ථාව සෑහෙන එකකි. ව්‍යවසායකයන්ට ඉඩ දී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සම්බන්ධව ගැටලු ඇතත් ආර්ථික ක්‍රියාවලියේ දී නිදහස විවෘතය. ආර්ථිකය වර්ධනය වන විට නිරායාසයෙන් ම ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණු ලක්ෂණ සමාජයට කාන්දුවෙයි.

එසේ ම ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණුව සමග වගකීම, අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව අලුත් කෝණයකින් විවාදයක් ආරම්භ වී තිබේ. වගකීම ඇත්තේ ආණ්ඩුවට පමණක්ද? යුතුකම ඉටුවිය යුතු ආණ්ඩුවෙන් හා අයිතිවාසිකම ඇත්තේ මහජනතාවටද? මෙම කරුණු විග්‍රහය අනුව සමාජයට ද

වගකීමක් ඇත. සමාජය ද යුතුකම ඉටු කළ යුතුය. පැවැත්ම ඉදිරියට යන්නේ ඒ අනුවය. අද මාධ්‍ය භාවිතාව පවා වෙනස් වී තිබේ. මාධ්‍ය පෙනී සිටිය යුතු වැරදි පෙන්වා දූෂණ හෙළිකර චූදිතයන් නම් කිරීමටද? එක් පැතිතකින් පමණක් බලා මහජනතාවට කරුණු දැක්වීම වගකීම නොවන බව අද යථාර්ථයයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවකට අනාගතය ගොඩ නැගීමට ඉඩ නොදී, වගකීමක් නැති විවේචන හා කඩාකප්පල් කිරීමේ අරමුණින් කරන අනාවරණ යුක්ති සහගත නැත. විශේෂයෙන් අන්තර්ජාලය ඔස්සේ පළවන සංස්කාරකවරයෙකුට යටත් නැති කෙලින්ම අදහස් පළ කරන වෙබ් හා බ්ලෝග් අඩවි මෙම චෝදනාවට ගොදුරු වී සිටී. තරඟකාරීව පුවත් පළ කරන්නට යාමෙන් වගකීම අමතක කළ මාධ්‍ය පාඩම් ඉගෙන ගෙන තිබේ. මෑතකදී වසා දැමූ News of the World පුවත්පත ප්‍රවෘත්ති සොයා ගැනීමට කළ භාවිතාවන් අනාවරණය වෙයි. වගකීමේ සීමාව පසුකර අන්තවාදී ගමනක් ගිය එයට එල්ල වී ඇති චෝදනා බරපතලය. අප මේ අලුත් ප්‍රවනතා ගැන අවධානයෙන් සිටිය යුතුය. ප්‍රතිසංස්කරණ ගැන අවධානය යොමු කිරීම අවශ්‍යය. ඇතැම් ප්‍රතිසංස්කරණ සමාජයට මිහිරි නැත. තවත් දේ පාලකයන්ට නොගැලපේ. මේ අතර ඇති මැද මාවත සොයා ගැනීම අපගේ අද දවසේ කාර්ය භාරයයි. ආර්ථික ව්‍යුහ, සමාජ තීන්දු කාලානුරූපව සංශෝධනය විය යුතුය. අවුරුදු අසූවක ප්‍රජාතන්ත්‍රවාද ගමන්මග තුළ ගැටුම් හා ඒ නිසා රජය ශක්තිමත් වූ වසර තිහක කාල පරිච්ඡේදයේ අපට අහිමි වූ යුගයේ වෙනස්කම් දෙස සාවධානව අවතීර්ණ වීම අවශ්‍යතාවයයි.

රජය ට වඩා සමාජය ශක්තිමත් වීම හා පුද්ගල මතවාදයන්ගෙන් සැදුම්ලත් සංවිධාන ආණ්ඩුවලට වඩා බලවත්වීම ද රජයකට දරා ගන්නට සිදුවන තත්ත්වයකි. මහජනතාව පිහිටුවාගත් සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන ආයතන සමහර අවස්ථාවලදී ආණ්ඩු වලට ද වඩා බලවත්ය. එය අද ප්‍රජාතන්ත්‍රවාදයේ තවත් පැත්තකි. මහජනතාව පිහිටුවන ආණ්ඩුවක ගමන්මගට වඩා කණ්ඩායමක් එකතු වී පිහිටුවා ගන්නා රාජ්‍ය නොවන සංවිධාන ශක්තිමත් වීම පිළිගත යුතු සත්‍යයකි. බිල්ගේට් පදනම ලෝකයේ සුවසෙත වෙනුවෙන් කරන වියදම ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදලට වඩා විශාල එකකි. මැලේරියාව, ඒඩ්ස් වැනි රෝග ඇතුලු විවිධ සෞඛ්‍ය පර්යේෂණ වලට එකී සංවිධානය කරන වියදම බලවත් රටකට පවා කළ නොහැකි එකකි. ජාත්‍යන්තර හා දේශීය සංවිධාන තම තමන්ගේ අරමුණු උදෙසා පිහිටුවාගත් ආයතන මගින් රජයේ සැලසුම් වලට පරිබාහිරව කරන සේවාව හෙලා දැකිය යුතු එකක් නොවේ. ඔවුන්ගේ සම්පත් ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයට වහල් කර ගත යුතු විනා එකී ආයතන පාලනය කරන්නට හෝ ඒවායේ මතය දෝෂ දර්ශනයට ලක්කරන්නට යාම නුවනට හුරු නැත. සාමකාමී පරිසරයක සියලු අංශ වලට තම සාධාරණ අරමුණු හා අපේක්ෂා අනුව ක්‍රියාකරන්නට අවස්ථාව තිබිය යුතුය.

ගතවූ කාලය ඇතුලත ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරියට ගමන් කර තිබේ. අලුත් දේ එයට එකතු වී ඇත. ගුණාංග වෙනස් වී ඇති අතර ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රායෝගික තත්ත්ව අනුව සකස් වී ඇති බව අවබෝධකර ගත යුතුය. තාක්ෂණය එකතු වීමෙන් හා සන්නිවේදනය දියුණුවීමෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ මුහුණුවර වෙනස්වී ඇත. මහජන නියෝජිතයාගේ වගකීම හා කාර්යභාරය තියුණු එකක් වී ඇත. නායකයන් ගේ තීරණ, ඔවුන් හැසිරෙන අන්දම තව දුරටත් රහස් නොවේ. වීරයන් වී මැතිවරණයෙන් විශිෂ්ට ලෙස ජයගන්නා දේශපාලනඥයන් ඉතාම කෙටි කාලයක් තුළ පිරිහෙන්නේ දියුණු සන්නිවේදන යුගය පතුරවන තොරතුරු සමගය. ගැටුම් වලට ගොදුරු වී, ත්‍රස්තවාදයට මුහුණ දුන් කලින් පරම්පරාවට වඩා වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදය සහමුලින් ම වෙනස් එකකි. ලෝකයේ දියුණු අංග ඔයට එකතු වී තිබේ. තොරතුරු දන්නා ඔවුහු මානව අයිතිවාසිකම් ප්‍රශ්න කරති. මාධ්‍ය නිදහස අගය කරති. තමන්ම සන්නිවේදකයෝ වී ක්ෂණයකින් ලෝකය පුරා අදහස් පතුරන්නට පටන් ගනිති.

අදට ගැලපෙන පරිදි වෙනස් විය යුතු ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නොවේ. ආර්ථිකය පමණක් නොවේ. සාහිත්‍ය, කලාව, සංගීතය ද අලුත් විය යුතුය. මිනිසුන්ගේ රසවින්දනය, සිතුම් පැතුම් යනාදිය පවා සාමකාමී සැනසිලිදායක යුගයකට ගැලපෙන පරිදි වෙනස් වීම අවශ්‍යය. අපේ අනන්‍යතාවය වැදගත්ය. ආගම, සංස්කෘතිය ආරක්ෂා කර ගත යුතුය. ඒ අතර ප්‍රජාතන්ත්‍රවාදයේ නව ප්‍රවනතා සමග සම්බන්ධ විය යුතුය. අනන්‍යතාවය හා සංස්කෘතිය ස්වකීය පදනම සේ තබාගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග තහවුරු කරගෙන ඇති ඉන්දියාව හා ජපානයේ අත්දැකීම් අපට විමසා බැලිය හැකිය. මෙම වෙනස්කම් බලයෙන් කරන්නට නොහැකිය. ස්වභාවික පරිවර්තනයකට ලක්වීමට ඉඩදීම

අවශ්‍යය. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවකට කළ හැක්කේ එයට විවෘත අවස්ථාවක් සැපයීමය. සමාජයේ සියලු දෙනාට සමාන අවස්ථාව සැපයීම, තොරතුරු ලබාගැනීම සහ කාන්තාවන් හා තරුණ සමාජයට අයිතිය දීම වෙනුවෙන් අවශ්‍ය නීති රීති වෙනස් කිරීම ගැන අවධානය යොමු කළ යුතුය. ඒ වෙනුවෙන් අවශ්‍ය තීරණ ගැනීමට විද්වත් සංවාදයක් අද රට තුළ ආරම්භ කළ යුතුය. බලය ශක්තියක් කර ගෙන ආණ්ඩු පවත්වාගෙන සිටි යුගයක සිට මහජනතාව හා මහජන සංවිධාන වල මතය බලවත්වන අවස්ථාවක් දක්වා තත්ත්වය තේරුම් ගැනීම අදඅ පට ඉතාමත් වැදගත්ය.